**සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගම - 2016/2017**

---

සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙහි 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 01 හි 138 ඡේදය ප්‍රකාරව සමාගමෙහි ලියාපදිංචි කාර්යාලයේ ලිපිනය, සමාගමෙහි ව්‍යාපාර කටයුතුවල ස්වභාවය, ව්‍යාපාරික ස්ථාන, මව් සමාගමෙහි නම, සමාගමෙහි ජීවිත කාලය යනාදී තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ හෙළිදරව් කළ යුතු වුවද එසේ හෙළිදරව් කර නොතිබුණි.

තවද ප්‍රමිතයේ 32 ඡේදයට පටහැනි ලෙස රු.1,491,156 ක් වූ ගෙවිය යුතු ශේෂය හා රු.150,000 ක් වූ ලැබිය යුතු ශේෂය හිලව්කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ජාතික තරුණ සේවා සභාවෙහි භූමිය හා අනෙකුත් සම්පත් උපයෝගී කරගෙන කිසිදු ගාස්තු ගෙවීමකින් තොරව සමාගමෙහි පරිපාලන හා ව්‍යාපාරික කටයුතු සිදු කිරීම යනාදී සම්බන්ධිත පාර්ශව ගනුදෙනු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 24 - සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම් ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය හෙළිදරව් කිරීම් සිදු කර නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ප්‍රකාරව, බදු වියදම තුළ ඇතුළත් ප්‍රධාන සංරචකයන් හා ආදායම් බදු ගණනය කිරීමට අදාල තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වුවත් එසේ හෙළිදරව් කර නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව, දේපළ පිරියත උපකරණවල ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය කළ යුතු වුවත් එසේ නොකිරීම හේතුවෙන් එකතුව රු.8,592,843 ක් වූ වත්කම් අයිතම 22 ක් සම්පූර්ණයෙන් ක්ෂය ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව වූ ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 08 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. එසේ වුවද, මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක 3.1.2 හි දක්වා ඇති ප්‍රතිපත්තිය මගින් වත්කම්වල ඵලදායී ජීව කාලය සහ ක්ෂය අනුපාත වාර්ෂිකව සමාලෝචනය කරන බව දක්වා තිබුණි.

(ඉ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජාතික තරුණ සේවා සභාවෙන් සමාගමට ලැබිය යුතු ණය ශේෂය රු. 63,454,032 ක් ලෙස දක්වා තිබූ නමුත් තරුණ සේවා සභාව විසින් ලබා දෙන ලද ශේෂ තහවුරුව අනුව එම ශේෂය රු.110,750 ක් වූයෙන් රු.63,343,282ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල පාරිතෝෂික වෙන්කිරීම රු. 53,675 ක් අඩුවෙන් සිදුකර තිබූ අතර, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ 2017 මාර්තු 31 දිනට පාරිතෝෂික සඳහා වෙන් කිරීම රු. 15,613,758 ක් වශයෙන් දක්වා තිබුණද ඊට අදාල ගිණුම්කරණ සටහන ඉදිරිපත් කර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දේපල පිරියත හා උපකරණවල ඇතුළත් වායුසමීකරණ යන්ත්‍ර වටිනාකම තුළ ණය පදනම මත මිලදීගත් බවට පිරිවැය රු. 114,400 ක් වූ නව යන්ත්‍රයක් ඇතුළත්ව තිබුණද එවැනි යන්ත්‍රයක් මිලදී ගෙන නොතිබීම හේතුවෙන් දේපල, පිරියත හා උපකරණ වටිනාකම සහ ණය හිමි වටිනාකම එම වටිනාකමින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඌ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ සඳහන් එකතුව රු. 1,341,156 ක් වූ සම්බන්ධිත පාර්ශවයන්ට ගෙවිය යුතු වටිනාකම පිළිබඳව සාක්ෂි ඉදිරිපත් නොවූ අතර, අදාල සම්බන්ධිත පාර්ශවයන්ගෙන් ලැබුණු තහවුරු අනුව, සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගම නමින් එවැනි ශේෂයක් නොපවතින බව අනාවරණය විය. තවද ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 හි, 32 ඡේදයට පටහැනි ලෙස රු. 1,491,156 ක් වූ ගෙවිය යුතු ශේෂය හා රු. 150,000 ක් වූ ලැබිය යුතු ශේෂය හිලව් කර දක්වා තිබුණි.

(එ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ අනෙකුත් ලැබිය යුතු දෑ තුළ ඇතුළත් එකතුව රු. 3,005,272 ක් වූ 2013 වර්ෂයට පෙර සිට පැවත එන ශේෂ 04 කට අදාලව විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් කර නොතිබුණි.

(ඒ) එකතුව රු.42,175,162 ක් වූ ණයගැති ශේෂ සම්බන්ධයෙන් ශේෂ තහවුරු ලිපි විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඔ) 2017 මාර්තු 31 දිනට එකතුව රු. 105,629,194 ක් වූ ණයගැති ශේෂවලින් සියයට 37 ක් වර්ෂ එකත්, වර්ෂ තුනත් අතර කාලපරිච්ඡේදයකට අයත් වූ අතර වර්ෂ 3 ඉක්ම වූ ණය ශේෂවල වටිනාකම රු. 7,103,342 ක් විය. මෙම ණය අයකර ගැනීමට ආයතනය තුල විධිමත් වැඩපිළිවෙලක් නොතිබුණි. තවද, මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 3.3 යටතේ බොල් ණය හා අඩමාන ණය සඳහා වෙන් කිරීම් කර ඇති බව දක්වා තිබුණද උක්ත ණයශේෂ සම්බන්ධයෙන් අදාල වෙන් කිරීම් සිදුකර නොතිබුණි.

(ඕ) ලාභාංශ බදු වගකීම වූ රු. 475,580 ක් ආදායම් බදු වටිනාකම තුළ ඇතුළත් වී නොතිබීම හේතුවෙන් වර්ෂයට අදාල බදු වියදම හා ආදායම් බදු වගකීම රු. 475,580 කින් අඩුවෙන් දක්වා තිබුණි.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------------

### 2.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------------

මෙම වාර්තාවේ 1.4 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව, මා විසින් පහත සඳහන් කරුණු දක්වමි.

(අ) තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම හා විගණනයේ විෂය පථය සහ සීමාකිරීම් ඉහත දක්වා ඇති පරිදි වේ.

(ආ) මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති වැදගත් සීමා කිරීම්වලට යටත්ව,

- විගණනය සඳහා අවශ්‍ය තොරතුරු සහ පැහැදිලි කිරීම් ප්‍රමාණවත් ලෙස ලැබුණු බවත්, මාගේ පරීක්ෂණවලින් පෙනීයන අන්දමට සමාගම විසින් ප්‍රමාණවත් පොත්පත් හා වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියේ අවශ්‍යතාවයට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

## 2.3 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති රීති, හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|---|
| (අ) | 1985 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල් පනතේ 47 හා 49 වගන්ති | සේවක අර්ථ සාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල් දායකය ගණනය කිරීමේදී අන්තර් දීමනා හා විශේෂ දීමනා හැර අනෙකුත් ඉපයීම් අදාලකර ගත යුතු බව දක්වා තිබුණද සමාගම විසින් ආරක්ෂක අංශයේ සේවකයන් ලබා ගනිමින් සිටි මූලික වැටුප නොසලකා, ආරක්ෂක සේවා කර්මාන්තය පිළිබඳ පඩිපාලක සභාව විසින් තීරණය කරන ලද අවම මාසික වේතනයට පමණක් දායක මුදල් ගණනය කර තිබුණි. |
| (ආ) | 2007 අංක 07 දරන සමාගම් පනතේ 133 වගන්තිය | එක් එක් ලිත් වර්ෂයකට වරක් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂික මහා සභා රැස්වීමක් පැවැත්විය යුතු වුවත් 2016/2017 මූල්‍ය වර්ෂයට අදාලව වාර්ෂික මහ සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. |

## 3 මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ සමාගමෙහි මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 5,737,553 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ ලාභය රු. 10,135,082 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය සියයට 43 කින් හෙවත් රු. 4,397,529 ක පිරිහීමක් පෙන්නුම් කර තිබුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව ආදායම රු. 23,902,948 කින් අඩුවීම සහ සෘජු පිරිවැය රු. 8,684,453 කින් වැඩිවීමත් ආරක්ෂක අංශයේ පරිපාලන වියදම රු. 27,732,675 කින් අඩුවී තිබීමත් ඉහත පිරිහීම සඳහා සෘජුවම බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2012/2013 වර්ෂයේදී රු.12,701,104 ක් වූ සමාගමේ ශුද්ධ ලාභය 2014/2015 වර්ෂය වන විට රු.19,270,251 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ නමුත් 2015/2016 වර්ෂයේදී රු.10,135,082 ක් හා සමාලෝචිත වර්ෂයේදී රු.5,737,553 ක් දක්වා අඛණ්ඩව අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ක්ෂය වීම් නැවත ගැලපීමේදී 2012/2013 වර්ෂයේදී රු.149,214,502 ක් වූ සමාගමේ දායකත්වය 2015/2016 වර්ෂයේදී රු.206,401,494 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබූ නමුත් සමාලෝචිත වර්ෂයේදී රු.177,679,584 ක් දක්වා අඩුවී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ ලාභය රු. 5,737,553 ක් වී තිබූ අතර, එය ඉකුත් වර්ෂයට සාපේක්ෂව සියයට 43 කින් අඩුවීමක් තිබුණද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට අනුව ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 7,377,384 ක් විය. ඉකුත් වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය රු. 5,175,868 ක සෘණ අගයක් ගෙන තිබූ අතර, ඒ අනුව සමාලෝචිත වර්ෂයේ ශුද්ධ මුදල් ප්‍රවාහය සියයට 242 කින් හෙවත් රු.12,553,252 කින් වර්ධනය වී තිබූ අතර වෙළඳ සහ අනෙකුත් ගෙවිය යුතු ශේෂය රු. 7,523,310 කින් වැඩිවීම මෙම තත්ත්වයට සෘජුලෙස බලපා තිබුණි.

සමාගමෙහි ද්‍රවශීලතා අනුපාත විශ්ලේෂණය කිරීමේදී ජංගම අනුපාතය හා ක්ෂණික අනුපාතය පිළිවෙළින් 2.6:1 ක් හා 2.5:1 ක් වූ අතර, ණයගැති ශේෂ තුළ දිගුකාලීනව අයනොවී පවතින ණයගැතිශේෂ පැවතීම හේතුවෙන් ඉහත තත්ත්වය සතුටුදායක තත්ත්වයක් නොවන බව නිරීක්ෂණය කෙරේ. තවද, ඉකුත් වර්ෂයට සාපේක්ෂව විකුණුම් ආදායම සියයට 9 කින් අඩුවී තිබුණද සෘජු පිරිවැය සියයට 25.5 කින් වැඩිවී තිබූ අතර ඒ හේතුවෙන් දළ ලාභ අනුපාතය සියයට 14.5 කින් අඩුවී තිබුණි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

---

## 4.1 කාර්ය සාධනය

---

### 4.1.1 සැලසුම් කිරීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව තම ව්‍යාපාර කටයුතු කෙටිකාලීන හා දිගුකාලීන දැක්මක් සහිතව කළමනාකරණය කළ යුතු බැවින් අවම වශයෙන් වසර තුනක කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් පිළියෙළ කර ඒ අනුව යෝජිත ඉලක්ක ළඟාකර ගැනීමට හැකිවන පරිදි ව්‍යාපාරය මෙහෙයවීම අධ්‍යක්ෂ මණ්ඩලයේ පූර්ණ වගකීම වුවත් සමාගම සඳහා සංයුක්ත සැලැස්මක් සකස් කර නොතිබුණි.

(ආ) උක්ත චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව, ඉදිරි මුදල් වර්ෂයේදී ක්‍රියාවට නැංවීමට අපේක්ෂිත වාණිජ ක්‍රියාකාරකම් ඇතුළත් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කළ යුතු අතර, ඊට වාර්ෂික අයවැය ලේඛනය, යෝජිත ප්‍රධාන ආයෝජන ධාරිතා පුළුල් කිරීම්, ප්‍රධාන ප්‍රසම්පාදනයන් ඇතුළත් වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම, මානව සම්පත් සංවර්ධන සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත විය යුතුය. එසේ වුවද, සමාගම විසින් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙළ කර තිබූ ක්‍රියාකාරී සැලැස්මෙහි එම කරුණු ඇතුළත් කර නොතිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---

සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ආපනශාලා දෙකෙහි ආදායම වැඩිකර ගැනීමේ අරමුණෙන් 2017 වර්ෂය සඳහා ඉදිරි සැලැස්මක් සකස් කර තිබුණත් සමාලෝචිත වර්ෂය නිමවන විටත් එහි ඇතුළත් ප්‍රධාන යෝජනා 07 ක් ක්‍රියාත්මක කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

---

ඉකුත් වර්ෂයට අදාලව සමාගම වෙත යොමු කරන ලද විගණන විමසුම් 19 කට සහ සමාලෝචිත වර්ෂයේදී නිකුත් කරන ලද එක් විගණන විමසුමකට 2018 ජූලි 30 දින වන විටද පිළිතුරු එවා නොතිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගමේ සාංගමික සංස්ථා පත්‍රය ප්‍රකාරව සී/ස ශ්‍රී ලංකා තරුණ සේවා (පුද්) සමාගම විසින් ක්ෂේත්‍ර 56 ක් ඔස්සේ තම සේවාවන් පුළුල් කිරීමේ හැකියාව තිබියදීත් ක්ෂේත්‍ර 4 කට සීමා වී තිබූ අතර එම සේවාවන් ව්‍යාප්ත කිරීමට සමාලෝචිත වර්ෂය තුළ කටයුතු කරන බවට කළමනාකරණය විසින් විගණනයට දන්වා තිබුණද 2018 මැයි 30 දින වන තෙක් ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ආපන ශාලාවේ අරක්කැමියන් දෙදෙනෙකු හා සහයක අරක්කැමියන් පස් දෙනෙකු සේවය කරමින් සිටියද වැඩි ඉල්ලුමක් පවතින කෙටි ආහාර සැකසීම අභ්‍යන්තරිකව සිදු නොකර බාහිර සැපයුම්කරුවන්ගෙන් මිලදී ගෙන තිබුණි. ඒ අනුව ඉතා අඩු ලාභාන්තිකයක් යටතේ විකුණා තිබූ අතර එම ආහාර අභ්‍යන්තරයේ සකසා ආදායම වැඩිකර ගැනීමට පියවර ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ඉදිරි සැලැස්මට අනුව, මුළුතැන්ගෙයි සේවය කරන සේවකයින් 7 දෙනෙකු මගින් මාසයක් තුළ ඉහළ ආපන ශාලාවේ අලෙවිය සඳහා පිළියෙල කිරීමට සැලසුම් කළ සාමාන්‍ය කෑම පාර්සල් ප්‍රමාණය දිනකට 300 ක් විය. එහෙත් 2017 මාර්තු මාසය තුළ සකස් කරන ලද දිනක සාමාන්‍ය ආහාර පාර්සල් ප්‍රමාණය 95 ක් පමණක් වී තිබූ අතර සභාව තුළ ක්‍රියාත්මක කරන වැඩසටහන් සම්බන්ධයෙන් නිසි සම්බන්ධීකරණයක් සිදුකර එම අවස්ථාවන්ට ආහාර සපයා ආදායම වර්ධනය කරගත හැකිව තිබුණ ද විගණනය විසින් සිදුකළ නියැදි පරීක්ෂාවට අනුව එසේ අභ්‍යන්තර වැඩසටහන් වලින් ආදායම ඉපයීම සම්බන්ධයෙන් අවධානය යොමු කර නොතිබුණි.

(ඈ) 2006 අංක 10 දරන දේශීය ආදායම් පනතේ 113 වගන්තිය ප්‍රකාරව, සමාගම විසින් ආදායම් බදු ගෙවා නොතිබුණු අතර පනතේ 106 වගන්තිය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ 05 ට අදාලව ආදායම් බදු වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. එසේ වුවද, ගෙවිය යුතු ආදායම් බදු වශයෙන් සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු. 10,981,533 ක් වෙන්කර තිබුණි. පනතේ 173(3) වගන්තිය ප්‍රකාරව ආදායම් බදු නොගෙවීම මත දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් රු. 4,655,091 ක දඩ පැනවිය හැකි බව විගණනයේ ගණනය කිරීම් අනුව නිරීක්ෂණය විය.

(ඉ) 2006 අංක 10 දරන දේශීය ආදායම් (සංශෝධිත) පනතේ 117/117A වගන්ති ප්‍රකාරව වැටුපෙන් උපයන විට ගෙවීමේ බදු අඩු කළ යුතු වුවත් සමාගමේ නිලධාරීන් දෙදෙනෙකුගෙන් උපයන විට ගෙවීමේ බදු අඩුකර නොතිබුණු අතර, උපයන විට ගෙවීමේ බදු යටතේ ලියාපදිංචි වී නොතිබුණි.

(ඊ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනතේ 2(2) වගන්තිය ප්‍රකාරව සමාගමක කාර්තුමය පිරිවැටුම රු. මිලියන 50 ක් ඉක්මවූ විට ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වුවද සමාගමේ කාර්තුමය පිරිවැටුම රු. 58,468,619 ක් වී තිබුණද පනත යටතේ ලියාපදිංචි වී

නොතිබුණි. මේ හේතුවෙන් ආර්ථික සේවා ගාස්තු වශයෙන් රු. 1,169,372 ක් සහ ඒ සඳහා වූ දඩ මුදල වශයෙන් රු. 157,800 ක් ගෙවිය යුතුව පවතින බව නිරීක්ෂණය විය.

(උ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු (සංශෝධිත) පනතේ 10 වගන්තිය ප්‍රකාරව සමාගමක පිරිවැටුම කාර්තුවකට රු. 3,000,000 හෝ වර්ෂයකට රු. 12,000,000 ඉක්මවන විට එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි විය යුතු වේ. එසේ වුවද, සමාගමේ කාර්තුවක පිරිවැටුම රු. 58,468,619 ක් වුවද එකතු කළ අගය මත බදු පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණි.

(ඌ) 2009 අංක 09 දරන ජාතිය ගොඩනැගීමේ බදු (සංශෝධිත) පනතේ 3 වගන්තිය ප්‍රකාරව සමාගමක කාර්තුවක පිරිවැටුම රු. මිලියන 3 ඉක්මවන්නේ නම් එම සමාගම විසින් කාර්තුමය පිරිවැටුම මත ජාතිය ගොඩනැගීමේ බදු ගෙවිය යුතු වේ. කෙසේ වුවද සමාගමේ කාර්තුවක පිරිවැටුම රු. 58,468,619 ක් වුවද සමාගම විසින් ජාතිය ගොඩනැගීමේ බදු පනත යටතේ ලියාපදිංචි වී නොතිබුණි. ඒ අනුව සමාගම විසින් ජාතිය ගොඩනැගීමේ බදු වශයෙන් රු. 4,677,489 ක් ද දඩය වශයෙන් රු. 631,400 ක් ද ගෙවිය යුතු බවට නිරීක්ෂණය කෙරේ.

(එ) 2008 අංක 10 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත (සංශෝධිත) යටතේ සමාගම ලියාපදිංචි වී නොතිබුණු අතර, පනතට අනුව සේවක දළ වැටුප රු. 25,000 ඉක්මවන විට රු. 25 ක් මුද්දර ගාස්තු අයකළ යුතු වුවත් මාසික දළ වැටුප රු. 25,000 ඉක්මවූ නිලධාරීන් 11 දෙනෙකුගේ වැටුපෙන් එසේ මුද්දර ගාස්තු අඩු කර නොතිබුණු බව නියැදි පරීක්ෂාවේදී අනාවරණය විය.

(ඒ) 2017 මාර්තු 31 දිනට නොපියවූ මුදල් අත්තිකාරම් ශේෂය රු. 721,805 ක් වූ අතර, අත්තිකාරම් ගෙවීම සම්බන්ධයෙන් අත්තිකාරම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි.

(ඔ) සමාගම විසින් නිසි මූල්‍ය කළමණාකාරීත්වයක් පවත්වාගෙන ගොස් නොතිබීම සම්බන්ධයෙන් ඉකුත් විගණකාධිපති වාර්තාවෙන් කරුණු අනාවරණය කර තිබුණ ද, සමාලෝචිත වර්ෂයේදී ද දිගින් දිගටම බැංකු අයිරා පවත්වා ගැනීම හේතුවෙන් 2016/2017 මූල්‍ය වර්ෂය තුළ රු. 398,607 ක් බැංකු අයිරා ගාස්තු වශයෙන්ද නිශ්කාෂණය වීමට පෙර චෙක්පත් මුදල් කර ගැනීම සඳහා රු. 526,709 ක් වට්ටම් ගාස්තු වශයෙන්ද ගෙවා තිබුණි.

## 4.4 වෙනත් ආයතන වෙත ලබා දුන් සමාගමේ සම්පත්

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.3.9 ඡේදය ප්‍රකාරව, රාජ්‍ය ව්‍යාපාර සතු සම්පත් වෙනත් රාජ්‍ය ආයතනවල පරිහරණය සඳහා යෙදවීමට අවසර ලබා දී නොමැති වුවද, සමාගමේ නිලධාරියෙකු වැටුප් ප්‍රතිපූරණය කිරීමේ පදනම මත 2010 දෙසැම්බර් සිට ජාතික තරුණ සේවා සභාවේ ගම්පහ දිස්ත්‍රික් කාර්යාලය වෙත අනුයුක්ත කර තිබුණි. 2017 මාර්තු 31 දින වන විට සමාගම විසින් එම නිලධාරියාට වැටුප් හා වේතන ලෙස එකතුව රු. 1,923,532 ක් ගෙවා තිබුණු නමුත් සභාව විසින් එම මුදල ප්‍රතිපූරණය කර නොතිබුණි.

## 4.5 කාර්යමණ්ඩල පරිපාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව, 2017 මාර්තු 31 දිනට සමාගමේ අනුමත කාර්ය මණ්ඩලය 84 ක් වූ අතර, පුරප්පාඩු 25 ක් පැවතුණි. එය අනුමත සේවක සංඛ්‍යාවෙන් සියයට 30 ක් වූ අතර, ඒ තුළ ගණකාධිකාරී තනතුරක් සහ සහකාර ගණකාධිකාරී

තනතුරු 2 ක් ඇතුළත්ව තිබූ අතර, 2017 දෙසැම්බර් 31 දින වන විට එක් සහකාර ගණකාධිකාරී තනතුරක් සම්පූර්ණ කර තිබුණි.

(ආ) තනතුරු 3 ක් සඳහා අනුමත කාර්ය මණ්ඩලයට වඩා නිලධාරීන් 3 දෙනෙකු බඳවාගෙන තිබුණි.

**5. තිරසාර සංවර්ධනය**

------------------------

**5.1 තිරසාර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම**

------------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 " න්‍යාය පත්‍රය " ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින නමුත් සමාලෝචිත වර්ෂයට අදාළව සමාගම විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න පිළිබඳ දැනුවත් වී නොතිබුණි. ඒ හේතුවෙන් සමාගමේ විෂයය පථය යටතට වැටෙන තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන් ද ඉලක්ක මත ළඟාවීම මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගෙන නොතිබුණි.

**6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය.**

----------------------------------------------

**6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

-----------------------------------------

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුලත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2017 දෙසැම්බර් 11 දින, එනම් දින 193 ක ප්‍රමාදයකින් පසුව ඉදිරිපත් කර තිබුණි.

**6.2 අභ්‍යන්තර විගණනය**

------------------------------

සමාගමෙහි අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපනය කර නොතිබුණු අතර 2014 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණනයක් සිදුකිරීමට හැකි බව ජාතික තරුණ සේවා සභාව විසින්, 2013 දෙසැම්බර් 03 දින පැවති රාජ්‍ය ව්‍යවසාය පිළිබඳ කාරක සභාවට දන්වා තිබුණද, සමාගමේ කටයුතු ජාතික තරුණ සේවා සභාවේ අභ්‍යන්තර විගණන ඒකකය මගින් සිදුකර නොතිබුණි.

**6.3 අයවැය පාලනය**

------------------

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් වාර්ෂික අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

**7. පද්ධති හා පාලනයන්**

-----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
| --- | --- |
| (අ) අයවැය පාලනය | සමාගමෙහි කාර්යසාධනය, සැලසුම් හා ඉලක්කයන්ට අනුකූල වන පරිදි වාර්ෂික අයවැය ඇස්තමේන්තු සකස් කිරීම හා ඊට අනුකූල වන පරිදි කටයුතු නොකිරීම. |
| (ආ) ගිණුම්කරණය | ගිණුම්කරණයට අදාල සියලු පොත්පත්, වාර්තා හා ලේඛන පවත්වා නොගැනීම. |
| (ඇ) අභ්‍යන්තර පාලනය | එක් නිලධාරියකුගේ කටයුතු තවත් නිලධාරියකුගේ අධීක්ෂණයට ලක්වන පරිදි හා තම රාජකාරි කටයුතු සම්බන්ධයෙන් වගකීම නිශ්චය වන පරිදි වැඩ බෙදීමක් හා රාජකාරි පැවරීමක් සිදු නොකිරීම. |
| (ඈ) ගබඩා පාලනය | භාණ්ඩ ලැබීම් හා නිකුත් කිරීම් නිසි පරිදි සටහන් වන පරිදි හා භාණ්ඩවල ආරක්ෂාව තහවුරු වන පරිදි ප්‍රමාණවත් පාලන ක්‍රම ගබඩා සම්බන්ධයෙන් පවත්වා නොගැනීම. |
| (ඉ) ණයහිමි හා ණයගැති පාලනය | ණය හිමියන් හා ණය ගැතියන් පිළිබඳ නිවැරදි තොරතුරු වාර්තා පවත්වා නොගැනීම සහ කල් ඉකුත්වූ ශේෂ නිරවුල් කිරීම සඳහා කටයුතු නොකිරීම. |